# වික්ටෝරියාවේ ළමා සුරක්ෂිතතා ප්‍රමිතීන්


**සරල භාෂා සාරාංශය**

## 1




ඔබේ සංවිධානය ආදිවාසී දරුවන් පිළිගනී. ඔවුන්ගේ සංස්කෘතිය ප්‍රකාශ කිරීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමට ඔබ ඔවුන්ට සහාය දක්වයි. ඔබ ජාතිවාදයට ඉඩ නොදෙයි.

## 2



ඔබේ සංවිධානයේ සෑම තරාතිරමකම සිටින සැමට ළමා ආරක්ෂාව වැදගත් වේ. ළමා අපයෝජන හෝ හානි පිළිබඳ අවදානම් ඔබ සොයා ගන්නේ කෙසේ ද, වළක්වා ගන්නේ කෙසේ ද සහ නවත්වන්නේ කෙසේ ද යන්න ඔබ ලේඛනගත කරයි.

## 3




අපයෝජනයෙන් ආරක්ෂා වීමට, දැනුවත් වීමට සහ සම්බන්ධ වීමට ඇති අයිතිවාසිකම් දැන ගැනීමට ඔබේ සංවිධානය දරුවන්ට සහාය වේ. ඔබ ඔවුන්ට විවෘතව කතා කිරීමට සහ ඔවුන්ට බලපාන තීරණවලට සහභාගී වීමට උදව් කරයි.

## 4

ඔබේ සංවිධානය පවුල්වලට සහ ප්‍රජාවට ඔබ කරන දේ සහ ඔබ දරුවන් හානිවලින් හා අපයෝජනයෙන් ආරක්ෂා කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව කියයි. ඔබ පවුල්වලට තම දරුවාට බලපාන තීරණවලට අදහස් දැක්වීමට සහ සහභාගී වීමට උදව් කරයි.



## 5



සෑම දරුවකු ම වෙනස් බවත් විවිධ අවශ්‍යතා ඇති බවත් ඔබේ සංවිධානය තේරුම් ගනී. ඔවුන්ට අවශ්‍ය තොරතුරු සහ උපකාර ලබා ගත හැකි බවට ඔබ සහතික වේ.

## 6

දරුවන් අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගැනීම සඳහා කළ යුතු දේ කාර්ය මණ්ඩලය දැන සිටියි. ඔවුන් ළමා ආරක්ෂාව පිළිබඳ තොරතුරු අවශ්‍ය විටෙක සටහන් කිරීම, වාර්තා කිරීම සහ බෙදා ගැනීම සිදු කරයි. දරුවන් සමග වැඩ කරන කාර්ය මණ්ඩලයට අවශ්‍ය පසුබිම් පරීක්ෂාවන් සිදු කර ඇත.



## 7

පැමිණිල්ලක් කරන ආකාරය හා පැමිණිල්ලක් කළ විට සිදු වන්නේ කුමක්දැයි පිළිබඳ දරුවන් හා ඔවුන්ගේ පවුල්වල අය දැනුවත්ව සිටිති. පැමිණිලිවලට නිසි ලෙස ප්‍රතිචාර දක්වන්නේ කෙසේදැයි ඔබේ කාර්ය මණ්ඩලය දැන සිටියි.



## 8



ඔබේ සංවිධානය ළමුන්ව අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගැනීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කර සහාය දක්වයි. ළමා අපයෝජනයේ හා හානිවල ලක්ෂණ සහ අපයෝජනය හා හානිය පිළිබඳ ගැටලු තිබේ නම් ඒ සඳහා කළ යුතු දේ පිළිබඳව ඔබේ කාර්ය මණ්ඩලය දැන සිටියි.


## 9

ඔබේ සේවාවන්, සැකසුම් සහ ක්‍රියාකාරකම් භාවිත කරන විට දරුවන් සුරක්ෂිත බව ඔබේ සංවිධානය විසින් සහතික කරයි. මෙයට දරුවන් මාර්ගගතව සම්බන්ධවන අවස්ථා ද ඇතුළත් වේ.



## 10

ඔබේ සංවිධානය දරුවන් අපයෝජන හා හානිවලින් ආරක්ෂා කර ගන්නා ආකාරය පරීක්ෂා කර වැඩිදියුණු කරයි.



## 11




ඔබේ සංවිධානයට ළමුන්ව අපයෝජනයෙන් හා හානිවලින් ආරක්ෂා කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ලිඛිත ප්‍රතිපත්ති ඇත. ඒවා තේරුම් ගැනීමට පහසු වන අතර, සියලු ම කාර්ය මණ්ඩලය ඒවා අනුගමනය කරයි.

වැඩිදුර තොරතුරු සඳහා, ළමා හා යෞවනයන් සඳහා වූ කොමිසම (Commission for Children and Young People) අමතන්න

**www.ccyp.vic.gov.au**

COMMISSION FOR CHILDREN AND YOUNG PEOPLE